# 多言語情報コーナー　　（令和７年　８月号）

## 1. තොචිගි නගරයේ බහු සංස්කෘතික සහජීවනය සඳහා වූ ප්‍රශ්නාවලි සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම පිළිබඳව

ජපන් ජාතික පුරවැසියන් සහ විදේශීය පදිංචිකරුවන්ට සංස්කෘතිය සහ චින්තන ක්‍රම අනුව එකිනෙකා තේරුම් ගැනීමට, පිළිගැනීමට සහ සහජීවනයෙන් සිටිය හැකි නගරයක් බිහිකිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශයක් ලෙස තොචිගි නගරය මෙම වසරේ "තොචිගි නගර බහු සංස්කෘතික සහජීවන ප්‍රවර්ධන සැලැස්ම" සකස් කරනු ලැබේ.

තොචිගි නගරය මගින් ජපන් පුරවැසියන්ගේ සහ විදේශීය පුරවැසියන්ගේ ආකල්ප පිළිබඳ සමීක්ෂණයක් සහ වර්තමාන තත්වය පිලිබදව අදහසක් ලබාගැනිමේ සැලැස්මක් ලෙස ප්‍රස්නාවලි සමීක්ෂණයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

විදේශීය පදිංචිකරුවන් සඳහා වන සමීක්ෂණය සඳහා "රැකියාව ", "ජීවන තත්වය ", "අධ්‍යාපනය " සහ "සහයෝගිතාවය " වැනි මාතෘකා ආවරණය කිරීමට අදහස් කර ඇත.
තොචිගි නගරයේ ජීවත් වන වයස අවුරුදු 12 හෝ ඊට වැඩි ඕනෑම කෙනෙකුට මෙම සමීක්ෂණය සඳහා සහභාගි විය හැක.

මෙම සමීක්ෂණයට සහභාගිවීම සඳහා කරුණාකර නගරයේ වෙබ් අඩවිය මගින් හෝ අත් පත්‍රිකාවේ QR කේතය කියවීම මගින් හෝ  ස්මාර්ට් ජංගම දුරකතනයක් හෝ පරිගණකයක් භාවිතයෙන් සහභාගිවිය හැක.
සහභාගිවිය හැකි අවසාන දිනය 2025 අගෝස්තු 31 වේ.

බහු සංස්කෘතික සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා යොමු කිරීමක් ලෙස ඔබෙන් අපට ලැබෙන ප්‍රතිචාර ක්‍රියා කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. බොහෝ විදේශිකයන්ට ප්‍රතිචාර දැක්විය හැකි බව සහතික කිරීම සඳහා, කරුණාකර ඔබේ මිතුරන්ට මෙම  සමීක්ෂණය පිලිබදව දැනුවත් කරන්න. ඔබගේ සහයෝගය අපි අගය කරමු.

## 2. ගංවතුර සහ නායයෑම් සඳහා ආපදා වැළැක්වීමේ තොරතුරු පිළිබඳව

ආපදාවක් යනු "කවදා හෝ කුමක් සිදු වුවහොත් නොව කවදා හෝ නිසැකවම සිදුවනු ඇත." ගංවතුරක් හෝ නායයෑමක් ඇති වුවහොත් ආරක්ෂිත ස්ථාන කරා යායුතු වන්නේ කවදාද යන්න තීරණය කිරීම සඳහා තොරතුරු රැස් කිරීම ඉතාම වැදගත් වේ. එවැනි හදිසි අවස්ථාවකදී තොරතුරු රැස් කිරීමේ ක්‍රම රාශියක් තිබීම ඉතා වාසිදායක වනුඇත.

ගංවතුර සහ නායයෑම් වැනි හදිසි අවස්ථාවල රාජ්‍ය , ප්‍රාන්ත සහ නගර වලින් හදිසි අවස්ථා තොරතුරු සහ හදිසි භූමිකම්පා අනතුරු ඇඟවීම් ස්වයංක්‍රීයව ස්මාර්ට්ෆෝන් වෙත බෙදා හරිනු ලැබේ.

ඔබට තොචිගි නගර වෙබ් අඩවිය, X, ෆේස්බුක් සහ නිල LINE වැනි දෑ මගින් හදිසි අවස්ථා පිළිබඳ තොරතුරු දැනගැනීමට හැකියාව ඇත. අධික වර්ෂාව සහ සුළි සුලන් වැනි දෑ පිළිබඳව තොරතුරු රූපවාහිනිය සහ ගුවන් විදුලිය මගින් එම තොරතුරු කල්තියා රැස් කළ හැකිය.

තොචිගි නගරයේ ප්‍රජා ගුවන් විදුලි මධ්‍යස්ථානය වන FM කුරරා 857, සවන්දීම සඳහා ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනයට බාගත කළ හැකිය. ව්‍යසනයකදී, හානි තත්ත්වය සහ ඉවත් කිරීමේ තොරතුරු පිළිබඳ උණුසුම් පුවත් සපයනු ලැබේ, එබැවින් ඔබට නගරයෙන් ඉවත් කිරීමේ තොරතුරු සහ ඉවත් කිරීමේ ස්ථාන පරීක්ෂා කළ හැකිය.

ආපදා වැළැක්වීමේ තොරතුරු අවස්ථා කිහිපයකට වර්ගකර ඇත, එහිදී තොචිගි නගරය "අනතුරු ඇඟවීමේ මට්ටම 4" නිවේදනයක් නිකුත් කළහොත්, සියලු දෙනාම අනතුරුදායක ස්ථානවලින් ඉවත් විය යුතුය.

කුඩා දරුවන් හෝ වැඩිහිටියන් සිටින පවුල් "අනතුරු ඇඟවීමේ මට්ටම 3" නිවේදන කිරීමකදී ඉක්මනින් ආරක්ෂිත ස්ථාන කරා ඉවත් වීම ආරම්භ කළ යුතුය.

මෙම ඉහත සඳහන් "අනතුරු ඇඟවීමේ මට්ටම" භාවිතා කර ආරක්ෂිත ස්ථාන වෙත ඉවත් කිරීමේ අවශ්‍යතාවය සහ ඉවත්වීම සඳහා දී ඇති හොඳම කාලය බව කරුණාකර මතක තබා ගන්න.

### 3. නිවසේ දී භූමිකම්පාවක් ඇතිවූ විට ඒ සඳහා සූදානම

භූමිකම්පාවක් අතරතුර සිදුවන දැඩි සෙලවීම මගින් ගෘහ භාණ්ඩ සහ විදුලි උපකරණ පෙරළීම හේතු වීම මගින් බරපතල තුවාල ඇති කළ හැකිවා පමණක් නොව, ආරක්ෂිත ස්ථාන වෙත ඉවත් වීමද දුෂ්කර විය හැක.ඔබ සහ ඔබේ පවුල ආරක්ෂා කර ගැනීම සඳහා, මූලික ආරක්ෂක පියවරයන් ආරම්භ කිරීම වැදගත් වේ.

ආරක්ෂිත ස්ථානයක් ලෙස ඔබේ නිවස තුළ ගෘහ භාණ්ඩ සහ වෙනත් බාධක වලින් තොර ස්ථානයක් වෙන්කර තබාගන්න.

ඔබ නිදා සිටියදී භූමිකම්පාවක් සිදුවුවහොත් එය භයානක විය හැක. දරුවන් හෝ වැඩිහිටියන් සිටින නිදන කාමරවල ගෘහ භාණ්ඩ තැබීමෙන් වැළකිය යුතුය.

ආරක්ෂිතව ඉවත් කිරීමක් සහතික කිරීම සඳහා, ගමන්කරණ ස්ථාන අවට හෝ පිටවීමේ දොරටු අසල පහසුවෙන් පෙරලිය හැකි ගෘහ භාණ්ඩ හෝ වෙනත් අයිතම තැබීමෙන් වලකින්න.
ඇඳුම් පැළඳුම්, පොත් රාක්ක, පිඟන් රාක්ක, ශීතකරණ, රූපවාහිනී ආදිය L-හැඩති ආධාරක දඬු සමඟ සම්බන්ද කර ආරක්ෂිතව තැබීමට වග බලා ගන්න.

භූමිකම්පාවක් කවදා සිදුවේදැයි ඔබ කිසි විටෙකත් නොදනී. හදිසි කම්පනයක් ක්ෂණිකව වටිනා ජීවිත සහ දේපල අහිමි කළ හැකිය, එබැවින් පෙර සූදානම් වීම ඉතා වැදගත් වන්නේ එබැවිනි.

## 4. "Live 119" වීඩියෝ වාර්තාකරණ පද්ධතිය පිලිබඳව

ගින්නක්, හදිසි අසනීපයක්, රථවාහන අනතුරක් හෝ වෙනත් හදිසි අවස්ථා වලදී, 119 ඇමතීමෙන් ඔබව තොචිගි නගර ගිනි නිවන දෙපාර්තමේන්තුවේ සන්නිවේදන විධාන මධ්‍යස්ථානයට සම්බන්ධ කරනු ඇති අතර, එහිදී ඔබට ගිනි නිවන රථයක් හෝ ගිලන් රථයක් ඉල්ලා සිටිය හැක.

හදිසි අවස්ථාවකදී, කරුණාකර සන්සුන්ව සහ කලබල නොවී ජපන් භාෂාවෙන් ස්ථානය සහ තත්වය පැහැදිලි කිරීමට දුෂ්කර විය හැකිය.

තොචිගි නගරය මගින් තොචිගි නගරයේ සන්නිවේදන විධාන මධ්‍යස්ථානය සහ 119 හදිසි තොරතුරු සන්නිවේදන අංශය මගින් එම ආපදා ස්ථානයේ සජීවී තත්වය "Live 119" වීඩියෝ වාර්තාකරණ පද්ධතිය මගින් සම්බන්දකරනු ලැබේ.

මෙය ඔබගේ ස්මාර්ට්ෆෝන් දුරකථනය මගින් 119 වෙත ඇමතුමක් ලබාගැනීමේදී එය වීඩියෝ දුරකථන මාර්ගයක් ලෙස වීඩියෝ පටිගත කිරීම මගින් එම අවස්ථාව සජීවීව තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට ඉඩ සලසන පද්ධතියකි.

මෙය ගිනි නිවන දෙපාර්තමේන්තු අණදෙන නිලධාරීන්ට තත්වය වඩාත් නිවැරදිව ග්‍රහණය කර ගැනීමට හැකි වන අතර එමඟින් ඉතා ඉක්මන් හා සුදුසු ප්‍රතිචාරයක් ලබා ගැනීමට හැකිවනු ඇත.

ස්මාර්ට් ජංගම දුරකථනයකින් 119 ඇමතුමක් ලබාගෙන ගිනි නිවන දෙපාර්තමේන්තුවේ සේවය අවශ්‍ය බව තීරණය වුවහොත්, ඇමතුම්කරුට වීඩියෝ දර්ශන එවන ලෙසට එහි නිලධාරියා ඉල්ලා සිටිය හැකි බැවින්, අපි ඔබගේ සහයෝගය ඉල්ලා සිටිමු.